**සමෘද්ධි සමාජ සංවර්ධන භාරකාර අරමුදල - 2018**

**-----------------------------------------------------**

## 1.1 තත්ත්වාගණනය කළ මතය

සමෘද්ධි සමාජ සංවර්ධන භාරකාර අරමුදලේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, අරමුදලේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වා ගෙනයාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

----------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

----------------

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

----------------------------------------------------------

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරීබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් ''මනාලෙස සැලසුම් කරන ලද'' අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් අරමුදල විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ. මේ සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණයක් පහතින් දැක්වේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| --------------------- | ------------------------------ | ------------- |
| මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී පොදු ලෙජරය පිළියෙල කර නොතිබුණු අතර ජ'නල් සටහන් හා ජ'නල් වවුචර් පිළියෙල කර නොතිබුණි. ඒ හේතුවෙන් සමාලෝචිත වර්ෂයේදී සිදුවූ සියළු ගනුදෙනු ගිණුමගතවී තිබුණේද යන්න තහවුරු කරගත නොහැකි විය. | 2022 වර්ෂයේ සිට ලෙජරය පවත්වා ගෙනයාමට කටයුතු කර ඇති බව. | ගිණුම්කරණයේ මූලික ලේඛණ විධිමත්ව පවත්වා ගැනීමට කටයුතු කළ යුතුය. |

### 1.5.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 7 ප්‍රකාරව නිලාවෙලි පුහුණු මධ්‍යස්ථානය සහිත අක්කර 7 පර්චස් 37 ක ඉඩම රු.126,255,800 කට මිලදී ගෙන තිබුණු අතර ඉඩම් හා පුහුණු මධ්‍යස්ථාන ගොඩනැඟිලි වෙන් වෙන්ව හදුනාගෙන ගිණුම් ගත නොකොට සමාලෝචිත වර්ෂයේ සියයට 10 ක් ක්ෂය කිරීමට කටයුතු කර තිබුණි. එමෙන්ම මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දක්වා ඇති වටිනාකම රු.6,003,155 ක් වූ පොතුවිල් සංචාරක නිවාසයේ නිත්‍යානුකූල අයිතිය වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව සතු බව ගිණුම්කරණ සටහන් මගින් හෙළිදරව් කර නොතිබුණි. | නිලාවෙලි පුහුණු මධ්‍යස්ථාන ගොඩනැගිල්ල සහ ඉඩම වෙන් වෙන් වශයෙන් දැනට තක්සේරු කොට නොමැති බැවින් එය ඉදිරියේදී වෙන් වෙන් වශයෙන් තක්සේරු කර ක්ෂය කිරීම් ගණනය කර ගිණුම්ගත කිරීමට කටයුතු කරන බව හා පොතුවිල් සංචාරක නිවාසය පිහිටි ඉඩමේ නීත්‍යානුකූල අයිතිය වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව සතු බව 2019 වර්ෂයේ සිට පිළියෙල කර ඉදිරිපත් කර ඇති ගිණුම් වාර්තා මගින් හෙළිදරව් කිරීමට කටයුතු කරන බව. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

### 1.5.3 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | අත්තිකාරම් පියවීම් රු.998,027 ක්ද, ප්‍රතිලාභි මුදල් ආපසු ලැබීම් රු. 38,553 ක්ද හා වියදම් ආපසු ලැබීම් රු.2,490,260 ක්ද ඇතුළුව මුළු එකතුව රු.3,526,840 ක් අදාළ ගිණුම්වලට ගැලපීම වෙනුවට වෙනත් ලැබීම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | අදහස් ඉදිරිපත් කර නොතිබුණි. | ගනුදෙනු නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | 2018 වර්ෂය සඳහා විගණන ගාස්තු වෙන්කර නොතිබුණි. | -එම- | වර්ෂයට අදාළ වියදම් වෙනුවෙන් නිසි පරිදි වෙන්කිරීම් කළ යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ ලැබිය යුතු ආයෝජන පොලියට අදාළව ගෙවිය යුතු රු.16,604,276 ක් වූ රඳවාගැනීමේ බදු ජංගම වගකීමක් ලෙස ගිණුම්ගත කිරීම වෙනුවට ලැබිය යුතු පොලී ආදායම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | 2018 වර්ෂයේ උපචිත පදනම මත ලැබිය යුතු ආයෝජන පොලියට අදාළ රඳවා ගැනීමේ බදු අතපසුවීමකින් ජංගම බැරකම් යටතේ පෙන්නුම් කිරීමට කටයුතු කර නොමැති බව. | ගනුදෙනු නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |

### 1.5.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| ගිණුම් විෂයය | වටිනාකම | ඉදිරිපත් නොවූ සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| | රු. | | | |
| (අ) සමෘද්ධි නිලධාරී යතුරු පැදි ණය අරමුදල | 8,664,920 | උපලේඛනයක් හෝ තහවුරු කෙරෙන වෙනත් ලිඛිත සාක්ෂි | 2021 වර්ෂයේ අවසන් ගිණුම පිලියෙල කිරීමේදී මෙම අරමුදල සමුච්චිත අරමුදලට බැර කිරීමට කටයුතු කර ඇති බව. | උපලේඛනයක් හෝ තහවුරු කෙරෙන වෙනත් ලිඛිත සාක්ෂි විගණනය සඳහා ඉදිරිපත් කළ යුතුය. |
| (ආ) වර්ගීකරණය නොකරන ලද කාර්යාල උපකරණ | | | | |
| ආරම්භක ශේෂය | 1,248,797 | උපලේඛන | අදහස් ඉදිරිපත් කර නොතිබුණි. | උපලේඛන විගණනය සඳහා ඉදිරිපත් කළ යුතුය. |
| ක්ෂය වෙන්කිරීම් | 1.118,450 | උපලේඛන | -එම- | -එම- |
| (ඇ) පරිපාලන වියදම් | 1,518,354 | වර්ගීකරණයන් | -එම- | වර්ගීකරණයන් විගණනය සඳහා ඉදිරිපත් කළ යුතුය. |
| (ඇ) වෙනත් වියදම් | 106,689 | වර්ගීකරණයන් | -එම- | -එම- |

### 1.6 ලැබිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දිස්ත්‍රික් ලේකම් කාර්යාල 05 ක 2012 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා පැවත එන රු.5,313,240 ක් වූ නොපියවූ අත්තිකාරම් වසර 02 සිට වසර 06 ක් දක්වා කාලයක සිට පියවා ගැනීමට කටයුතු කර නොතිබුණි. | 2018 වර්ෂයේ නුවර එළිය දිස්ත්‍රික්කයට ලබාදී තිබුණු අත්තිකාරම් වලින් පියවා නොතිබුණු රු.5,055,400 ක අත්තිකාරම් මුදල 2021 වර්ෂයේ පියවා ඇති බව හා ඒ අනුව 2012 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා නිරවුල්වී නොතිබුණු රු.257,840 ක මුදල හැකි ඉක්මනින් නිරවුල් කිරීමට කටයුතු කරන බව. | නොපියවූ අත්තිකාරම් පියවා ගැනීමට කටයුතු කළ යුතුය. |

## 1.7 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2016 මාර්තු 31 දිනැති අංක 2016/05 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | භාණ්ඩ සමීක්ෂණ කටයුතු සිදුකර වත්කම්වල නිවැරදිතාවය සනාථ කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව භාණ්ඩ සමීක්ෂණ කටයුතු ඉදිරියේදී සිදු කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා බව. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 15.1 ඡේදයේ ඇතුළත් මුදල් රෙගුලාසි 877(1) | අරමුදලේ කටයුතු සම්බන්ධයෙන් අයවැය ලේඛනයක් හා ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර නොතිබුණි. | අරමුදලේ කටයුතු සම්බන්ධයෙන් 2022 වර්ෂයේ අයවැය ලේඛනය යාසහ ක්‍රිකාරී සැලැස්ම පිළියෙල කර ඇති බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අරමුදලේ මූල්‍ය ප්‍රතිඵලය රු.1,150,393,688 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.778,303,991 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.372,089,697 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි. මෙම වර්ධනයට සමාලෝචිත වර්ෂයේ වෙනත් ලැබීම් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ ක්‍රියාකාරකම්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමෘද්ධි සමාජ සංවර්ධන භාරකාර අරමුදලේ භාර ඔප්පුවේ 6(9) ඡේදය ප්‍රකාරව, මණ්ඩලයේ කිසිදු සාමාජිකයෙකු විසින් | භාරකාර මණ්ඩල අනුමැතිය මත අධ්‍යක්ෂ ජනරාල්වරුන් වෙත අරමුදලේ වැඩබැලීම වෙනුවෙන් | භාරකාර අරමුදලේ භාර ඔප්පුවේ 6(9) ඡේදය ප්‍රකාරව කටයුතු කළ |

| | | |
|---|---|---|
| සිදුකරන ලද ප්‍රත්‍ය උපකාරයක් වෙනුවෙන් වැටුපක්, දීමනාවක් හෝ ප්‍රසාද දීමනාවක් හිමි නොවන නමුත්, නිල බලයෙන් අරමුදලේ සභාපති ලෙස කටයුතු කර තිබුණු සමෘද්ධි දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරු තිදෙනෙකු වෙත සමාලෝචිත වර්ෂයේදී වැඩබැලීමේ වැටුප් ලෙස රු.215,660 ක් ගෙවා තිබුණි. | දීමනා ගෙවා ඇති බව. | යුතුය. |

**4.** **ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

-----------------------------------------

**4.1** **මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

---------------------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 15.1 ඡේදයේ ඇතුළත් මුදල් රෙගුලාසි 877(2)(ඇ) ප්‍රකාරව අරමුදලේ මූල්‍ය ප්‍රකාශන ගිණුම් වර්ෂය අවසන් වී මාස 02 ක් තුළ මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවට පිටපතක් සහිතව විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වසර 03 ක ප්‍රමාදයකින් පසුව 2022 මැයි 19 දින විගණනය වෙත ඉදිරිපත් කර තිබුණි. | 2018, 2019 සහ 2020 වර්ෂවල අවසන් ගිණුම් 2022 මාර්තු 09 වන දින ද 2021 වර්ෂයේ අවසන් ගිණුම 2022 මාර්තු 28 දිනද රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල් වෙත පිටපතක් සහිතව විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කර ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |